**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 ට අනුව භාණ්ඩ බෙදාහැරීම සහ හිමිකම මාරු වූ විට භාණ්ඩ/ සේවා අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනා ගැනෙන බව දක්වා තිබුණද, ව්‍යාපාර කළමණාකරණය සිංහල හා දෙමළ ඩිප්ලෝමාව සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂාවේදී මොඩියුල අවසන් කිරීම මත පදනම වෙනුවට මුදල් ලැබෙන අවස්ථාවේදී ආදායම හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.204,000 ක් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ සිට ආදායම හඳුනා ගැනීමේ දී උපචිත පදනම මත ආදායම ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබයි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපාර කළමනාකරණ සිංහල ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශිෂ්‍යයෙකුගෙන් ආයතනයට රු.56,000 ක මුදලක් වර්ෂය තුල ලැබී තිබුණි. මෙම පාඨමාලාවට අයත් මොඩියුල 12 න් එකක් පමණක් යථෝක්ත වර්ෂයේදී අවසන් කර ඇති නමුත් සම්පූර්ණ පාඨමාලා ගාස්තුව ආදායම් ලෙස හඳුනාගැනීම නිසා වාර්ෂික ලාභය රු.52,000 කින් වැඩියෙන් දැක්වුණි. | 2023 වර්ෂයේ සිට ආදායම හඳුනා ගැනීමේ දී උපචිත පදනම මත ආදායම ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබයි. | උපචිත පදනම මත අදායම ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2020 මූල්‍ය වර්ෂය සඳහා විගණන ගාස්තුව රු.162,200 ක් එම වර්ෂයේදී ප්‍රතිපාදනය නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | 2020 වර්ෂය සඳහා පමණක් විගණන ගාස්තු වෙන් කිරීමක් සිදු වී නොමැත. 2021 වර්ෂයේ සිට නිවැරදිව විගණන ගාස්තු වෙන් කිරීමට කටයුතු කර ඇත. | විගණන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත** | | | |
| | (i) 3 (ඈ) උප වගන්තිය ප්‍රකාරව පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම ආයතනයේ එක් ප්‍රධාන අරමුණක් වුවත් 2023 මාර්තු 31 දින දක්වා එවැනි පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවාවක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් 2023 වර්ෂයේ සිට භාණ්ඩාගාරය වෙතින් කිසිදු ප්‍රතිපාදනයක් ලබා ගැනීම සිදු නොකරයි. එබැවින්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් උපයන ආදායමින් පුස්තකාලයක් ස්ථාපනය කිරීමේ කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලබයි. විද්‍යුත් ප්‍රකාශන ඇතුළත් වෙබ් පිටුවේ සැකසීම් 2023 මැයි මාසය තුළ නිම කෙරේ. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| | (ii) 3 (ඉ) උපවගන්තිය ප්‍රකාරව සමාන අරමුණු සහිත ජාතික හා විදේශීය ආයතන සංවිධාන සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සිදු කලයුතු වුවද එවැනි වැඩසටහන් විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 මාර්තු 29 දින අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දේශීය නියෝජිත සමඟ පැවති රැස්වීමේ උපදෙස් අනුව, ඉන්දියාවේ V V Giri National Labour Institute සමඟ අවබෝධතා ගිවිසුමක් ඉදිරියේ දී අත්සන් කෙරේ. ඉන් අනතුරුව කොරියාවේ හා ජපානයේ ශ්‍රම අධ්‍යයනය සම්බන්ධ ආයතන සමඟ ද සහයෝගීතාවයක් ඇති කර ගැනීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙන් සහයෝගය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| | (iii) 4 (උ) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු | අදාල අවබෝධතා ගිවිසුම් හරහා සහයෝගීතාවය වර්ධනය කිරීමෙන් පුහුණු අවස්ථා ලබා ගැනීම, නිරීක්ෂණ චාරිකා, | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| | සහිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි වෙනත් ආයතන සමඟ පුද්ගලයන් හුවමාරු කර ගැනීම හා පුහුණු කිරීම, පර්යේෂණ හා උපදේශක සේවා පිළිබඳ සහ සාමාන්‍යයෙන් ඔවුනොවුන්ගේ පොදු අරමුණු ඉදිරියට ගෙන යාම පිණිස විය හැකි යම් කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුලත් වීම සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | පර්යේෂණ කටයුතු සඳහා සහය, ප්‍රකාශන හුවමාරුව යනා දී කාර්යයන් රාශියක් ඉටු කර ගත හැකි වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,874,140 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.13,109,428 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,764,712 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම් සහ ස්ථාවර තැන්පතු පොළී ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට අනුව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා ස්ථිර තනතුරක් පවතී. එය ආයතනයේ පරිපාලනය සම්බන්ධයෙන් සමස්ත වගකීම සහ වගවීම සහිත ඉහළම විධායක සාමාජික තනතුර වන අතර මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට ආයතනය මේ දක්වා කටයුතු කර නොතිබුණි. විභාග අංශයේ වැඩසටහන් නිලධාරී සහ සහකාර අධ්‍යක්ෂක තනතුරු සඳහා නිලධාරීන් බඳවා නොගැනීමෙන් විධිමත් පරිදි රාජකාරි ඉටු නොවන බව නිරීක්ෂණය විය. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ද්විතීයන පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු පූර්ණ කාලීනව පත් කර ඇත. මෙය අර්ධ රාජ්‍ය ආයතන සඳහා ආයතන ප්‍රධානීන් පත් කරනු ලබන එක් ක්‍රමයක් වේ. | පරිපාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යා හැකි වන ලෙස පත්කිරීම් සිදුකල යුතුය. |
| (ආ) | ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා 2020 ජූලි මාසයේදී පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබුණද විගණිත දින දක්වා විධිමත් ලෙස නිලධාරියෙකු සේවයේ යෙ ාදවා නොමැති බැවින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම ගැටලු සහගත විය. | මෙම තනතුරු බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ආයතනය විසින් ගනු ලැබුව ද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් අදාළ බඳවා ගැනීම සිදු කිරීමට නොහැකිව ඇත. | ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට හැකිවන ලෙස නිලධාරීන් සේවයේ යෙදවිය යුතුය. |